## මොරටුව විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ විශ්වවිද්‍යාල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයන්හි තනතුරේ තහවුරු කරන ලද ස්ථිර සේවකයන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කළ අයදුම්පත් හා අදාළ ලේඛන තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරි/මණ්ඩපාධිපති/අධ්‍යක්ෂ මගින් 2026.08.31 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරි /ආයතන (අනධ්‍යයන) වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

### කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන)

**අවශ්‍ය සුදුසුකම් :**

1. අ.පො.ස (සා.පෙළ) විභාගය පහත සඳහන් විෂයයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.
   - (i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
   - (ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
   - (iii) ගණිතය

   සහ

2. අ.පො.ස (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් ඇති අය සඳහා ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

අ. පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

ආ. පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් තිබීම.

**තනතුරට විශේෂ වූ සුදුසුකම්**

ඉහතින් දක්වා ඇති සුදුසුකම්වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර III ශ්‍රේණිය (ගබඩා පාලන) තනතුරට විශේෂ වූ සුදුසුකම් සපුරාලිය යුතුය.

ගබඩාකරණය පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්දක් සහ/හෝ අ.පො.ස (සා.පෙළ) විභාගයේ වාණිජ්‍ය විෂයය සමත්වීම හෝ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ගිණුම්කරණය විෂයය සමත්වීම.

**සටහන :** විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුය.

**වැටුප් ක්‍රමය :** UMN 1 (III) - රු. 49,475 – 17 X 540 – 58,655 (මාසික)
කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2025 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ.**

**බඳවා ගන්නා ක්‍රමය :** ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මගින්

ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය.

- සිංහල /දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම
- බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
- පරිගණක සාක්ෂරතාවය
- ගබඩා පාලනය සම්බන්ධව දැනුම

**ආයතනික චක්‍රලේඛ ලිපි අංක 06/2020 අනුව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තනතුරකින් වෙනත් තනතුරකට පත්කිරීමේදී රජයේ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 09 වන වගන්තියට අනුව අදාල වැටුපෙහි පිහිටවනු ලැබේ.

ලේඛකාධිකාරි
මොරටුව විශ්වවිද්‍යාලය
මොරටුව
2026.08.10